චක්‍ර ලේඛ අංක 08/2016

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/01/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ-මේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகத் திணைக்களம்
## REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgdept.lk

දිනය / திகதி / Date: 2016.09.14

(A) 15

---

සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

### මරණ ප්‍රකාශය (ලියාපදිංචි කිරීම - බී 33) සංශෝධනය කිරීම

දිවයිනේ සියළුම රජයේ සහ පෞද්ගලික රෝහල් තුළ සිදුවන මරණ පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට "මරණ ප්‍රකාශය (ලියාපදිංචි කිරීම - බී 33)" නව සංශෝධිත ආකෘතිය භාවිතා කල යුතු බවට උපදෙස් දෙමින් අංක 02-165/2015 දරණ චක්‍රලේඛය, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සියළුම රජයේ හා පෞද්ගලික රෝහල් වෙත නිකුත් කර ඇත. එහි පිටපතක් මේ සමග අමුණා ඇත.

02. ඒ අනුව, නව සංශෝධිත බී 33 ආකෘතිය පිටපත් තුනකින් සකස් කර රෝහල් අධිකාරීන් විසින් නිකුත් කරනු ලබන,

මුල් පිටපත - මියගිය අයගේ ඥාතීන් වෙත නිකුත් කිරීමටත් ,
දෙවන පිටපත - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සංඛ්‍යා ලේඛන අංශය වෙත මාසිකව යොමු කිරීමටත්,
තුන්වන පිටපත - රෝහල භාරයේ තබා ගැනීමටත්, පියවර ගත යුතු බව ඉහත චක්‍ර ලේඛයෙන් උපදෙස් දී ඇත.

03. මියගිය අයගේ ඥාතීන් විසින් උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් වෙත මරණය පිළිබඳව දැනුම්දීමේ ලියවිල්ලක් වශයෙන් "ලියාපදිංචි කිරීම බී 33"දරණ සංශෝධිත නව ප්‍රකාශ පත්‍රය සහ "මරණ ලියාපදිංචි කිරීමේ ප්‍රකාශ පත්‍රය - CR- 2" ද සමග ඉදිරිපත් කළ පසු, මරණය ලියාපදිංචි කර, එම ප්‍රකාශ පත්‍ර මරණ ලේඛනයේ දෙවන පිටපතට අමුණා තැබිය යුතුවේ. මෙම උපදෙස් පිළිබඳව ඔබගේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සේවය කරන සියළුම උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීමට කාරුණිකව කටයුතු කරන්න.

04. තවද, බී 33 ආකෘතියේ දෙවන පිටපත රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශයට තැපැලෙන් එවිය යුතු බවට රෝහල් අධිකාරීන් දැනුවත් කරන්න. අවශ්‍යතාවය මත රෝහල් වෙත නිකුත් කිරීම සඳහා, බී 33 නව ආකෘති පොත් ප්‍රමාණවත් තොග ඔබ භාරයේ ගබඩාකර තබා ගන්න. මෙම වැඩපිළිවෙළ නිසි පරිදි ක්‍රියාත්මක කරවීමට ඔබගේ නිරන්තර අධීක්ෂණයද වැදගත් වන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්
O/C
පී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

1. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු, දැ.ගැ.ස.
2. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - කරු, දැ.ගැ.ස.
3. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,මධ්‍යම ලේඛනාගාරය - කරු, දැ.ගැ.ස.
4. කලාප භාර සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරු, දැ.ගැ.ස.
5. අධ්‍යක්ෂ, සංඛ්‍යාලේඛන අංශය, රෙජි.ජ.දෙපා. - කරු, අ.ක.ස.
6. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - කරු, දැ.ගැ.ස.
7. ගණකාධිකාරී, සැපයුම් - කරු, අ.ක.ස.